මාධ්‍ය නිවේදන අංක LAE/2023/02

මාධ්‍ය නිවේදනය

මැතිවරණ කොමිෂන් සභාව

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023**
**නාමයෝජනා භාර ගැනීම**

ඉදිරියේ දී පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන 340ක (ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ප්‍රාදේශීය සභාව හැර) එනම් මහ නගර සභා 29ක්, නගර සභා 36ක් හා ප්‍රාදේශීය සභා 275ක් සඳහා නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, සභාපති/ නියෝජ්‍ය සභාපති සහ සභිකයන් තෝරා පත් කරගැනීම සඳහා නාම යෝජනා භාර ගැනීමට අදාළ නිවේදන මේ වන විට අදාළ පළාත් පාලන ආයතනවල ප්‍රසිද්ධ කොට ඇත.

ඒ අනුව ඡන්ද විමසීම සඳහා ඇප මුදල් තැන්පත් භාර ගැනීම 2023.01.04 දින සිට 2023.01.20 දින මධ්‍යාහ්න 12.00 දක්වා ද (මෙම කාලය අතරතුර එළඹෙන 2023.01.06 පෝය දින හා 2023.01.08, 2023.01.15 යන ඉරිදා දිනවල දී හැර) නාම යෝජනා භාර ගැනීම 2023.01.18 දින සිට 2023.01.21 දින මධ්‍යාහ්න 12.00 දක්වා ද ඒ ඒ දිස්ත්‍රික් ලේකම්/ දිසාපති කාර්යාලවල දී සිදු කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2023 ජනවාරි මස 04